කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි සිව්වන වසර පරීක්ෂණය (බාහිර)-2021

2024 - අගෝස්තු

**BCOM E 4033 - කළමනාකරණ තොරතුරු පද්ධති**

මුළු ප්‍රශ්න සංඛ්‍යාව හතරයි : (04) කාලය : පැය 03 යි

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

---

ප්‍රශ්න අංක - 01

අ. තොරතුරු පද්ධතියක් යනු කුමක්ද? තොරතුරු තාක්ෂණය සහ තොරතුරු පද්ධතිය අතර වෙනස හඳුනා ගැනීමෙන් ඔබේ පිළිතුර කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 06)

අ. නූතන ව්‍යාපාරික ආයතනවල තොරතුරු පද්ධති සඳහා ඇති අභියෝග මොනවාද? පැහැදිලි කරන්න.

(ලකුණු 07)

ඇ. උපායමාර්ගික ව්‍යාපාරික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපාරික ආයතන තොරතුරු පද්ධතිවල විශාල වශයෙන් ආයෝජනය කරයි. එම අරමුණු පැහැදිලි කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 25)

ප්‍රශ්න අංක - 02

අ. උදාහරණයක් භාවිතා කරමින් දත්ත සහ තොරතුරු අතර වෙනස හඳුනා ගන්න.

(ලකුණු 06)

ආ. තොරතුරු පද්ධති සහ පරිගණකගත තොරතුරු පද්ධති අතර සම්බන්ධය කුමක්ද? සාකච්ඡා කරන්න.

(ලකුණු 07)

ඇ. සංවිධානයක ප්‍රධාන කළමනාකරණ මට්ටම්වලට සේවය කරන ප්‍රධාන තොරතුරු පද්ධති වර්ග හඳුනාගෙන සාකච්ඡා කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 25)

ප්‍රශ්න අංක - 03

අ. ඕනෑම තොරතුරු පද්ධතියක දත්ත සහ තොරතුරු සඳහා අවදානමක් ඇති කළ හැකි විවිධ හේතු තුනක් හඳුනා ගන්න.

(ලකුණු 05)

ආ. සාම්ප්‍රදායික ගොනු පරිසරයක් ඕනෑම ආයතනයකට ගැටලු ගණනාවක් ඇති කළ හැක. මෙම ගොනු ප්‍රවේශය නිසා ඇති විය හැකි ගැටළු හතරක් (4) සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

ඇ. තොරතුරු පද්ධති ව්‍යාපාරයක් පරිවර්තන කරන්නේ කෙසේද සහ අද ව්‍යාපාරයක් පවත්වාගෙන යාමට සහ කළමනාකරණයට ඒවා අත්‍යවශ්‍ය වන්නේ ඇයි? සාකච්ඡා කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 25)

ප්‍රශ්න අංක - 04

අ. ඊ-වාණිජ්‍ය යනු කුමක්ද? කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05)

ආ. උදාහරණ සපයමින් පහත ඊ-වාණිජ්‍ය ආකෘති කෙටියෙන් පැහැදිලි කරන්න.

- ව්‍යාපාරයෙන් පාරිභෝගිකයාට
- ව්‍යාපාරයෙන් ව්‍යාපාරයට
- පාරිභෝගිකයා සිට පාරිභෝගිකයා දක්වා

(ලකුණු 06)

ඇ. ඊ-වාණිජ්‍ය පරිසරයේ ඇති ප්‍රධාන ආරක්ෂක තර්ජන තුනක් (3) හඳුනාගෙන කෙටියෙන් පැහැදිලි කරන්න?

(ලකුණු 06)

ඉ. ඊ-වාණිජ්‍ය ව්‍යාපාර ප්‍රවර්ධනය සහ වර්ධනය සඳහා සමාජ මාධ්‍යවල කාර්යභාරය සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 25)